මගේ අංකය: 3/5/පත්කිරීම්/2021
මානව සම්පත් කළමනාකරණ අංශය
රාජ්‍ය දැව සංස්ථාව
2021.04.08

සාමාන්‍යාධිකාරී
අතිරේක සාමාන්‍යාධිකාරී (වැඩ ආවරණ)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්
සහකාර සාමාන්‍යාධිකාරීවරුන්
ප්‍රාදේශීය කළමනාකරුවන්
කළමනාකරුවන්/නියෝජ්‍ය කළමනාකරුවන්
ඒකක ප්‍රධානීන්
සංස්ථාවේ සියළුම සේවකයින් වෙත.

# පුරප්පාඩු

රාජ්‍ය දැව සංස්ථාවේ පුරප්පාඩුව පවතින **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක)** තනතුරෙහි පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් 2021.05.10 දින හෝ ඊට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) වෙත ලැබෙන සේ එවිය යුතුය. තැපැලේදී අස්ථාන ගතවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් තම අයදුම්පත් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කර අංශ ප්‍රධානියා /ප්‍රාදේශීය කළමනාකරු/ඒකක ප්‍රධානි මගින් ඉදිරිපත් කළ යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන ආදර්ශ අයදුම්පත් www.timco.lk යන වෙබ් අඩවියෙන් භාගත කල හැක).

## 1. "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" සේවා ගණය (HM)

**1.1. තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක) (HM 1-2)**

**වැටුප් පරිමාණය: රු. 81,670 - 2,270×15 – 115,720**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්(පහත I හෝ II)**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගණකාධිකරණය / වාණිජ්‍ය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters') ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක , ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක , ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II )**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. කළමනාකාර(MM 1-1) සේවා ගණයෙහි I ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර හතක (07) ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**1.2. බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්‍ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

**1.3. ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේකඅධ්‍යාපන/වෘත්තිය සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

**1.4.** වයස : වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**1.5. ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක(03) ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ.

**1.6. සුදුසුකම් ලබන දිනය**

අයදුම්පත් කැඳවන අවසාන දින වන විට ඉහත දක්වා ඇති **සුදුසුකම් සම්පූර්ණ** කර තිබිය යුතුය.

**1.7. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට දායක කරනු ලැබේ. උසස් කරනු ලබන සංස්ථා සේවකයින්ට බලපාන පොදු කොන්දේසි අදාල වේ.

<u>සටහන I</u> (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා)

අදාල අංශ ප්‍රධානීන්ගෙන් හෝ ප්‍රාදේශිය කළමනාකරුවන් මඟින් ඉල්ලුම් පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් පිළිබඳව සේවා ඇගයීම් වාර්තාවක් ගෙන්වා ගැනිමට කටයුතු කරනු ලැබේ.

- **ඉහත සතුටුදායක සේවා කාලය යනු උසස්වීම් සඳහා අයදුම්කරන දිනට පූර්වාසන්න වසර 05 ක සේවා කාලය තුල යෙදුනු සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූ ද ඒ කාලය තුල කල වරදකට (අවවාද කිරිමක් හෝ තදින් අවවාද කිරිමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූද සේවා කාලයකි.**

**සභාපති,**
**<u>රාජ්‍ය දැව සංස්ථාව.</u>**